www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**නික් බීම්ස් සිඩ්නි සහ මෙල්බර්න් හි දී දේශනයන් පවත්වයි**

# දෙවන ලෝක යුද්ධය: පාඩම් හා අනතුරු ඇඟවීම්

## World War Two: Lessons and Warnings

**නික් බීම්ස් විසිනි**

**2009 නොවැම්බර් 18**

*පහත පලවන්නේ 2009 නොවැම්බරයේ සිඩ්නි හා මෙල්බර්න් ශ්‍රාවකයන් වෙත ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික නික් බීම්ස් විසින් කල දේශනයේ සටහන්ය.*

**දෙ**වන ලෝක සංග්‍රාමයේ 70 වන සංවත්සරය ගැන සැලකීමේදී, එය මුදාහල ව්‍යසනයේ අර්ථයෙන් ඒ කෙරෙහි පලව ඇත්තේ නොතැකීමේ හා පුදුම එලවන සුලු යයි ද කිව හැකි ප්‍රතිචාරයකි. මෙය, විසිවන සියවසේ ම්ලේච්ඡතම සිදුවීමයි. එහි ප්‍රතිඵලය වූයේ, සෝවියට් සංගමයේ මිලියන 27 ක් තරම් ද චීනයේ මිලියන 20 ක් තරම් ද වන, සමස්ත වශයෙන් මිලියන 70 කට අධික ජීවිත විනාශයකි. යුද්ධය වචනයෙන් කිව නොහැකි තරමේ ප්‍රචන්ඩත්වයක් මුදා හලේය. මිලියන 6 ක් තරම් යුරෝපීය යුදෙව්වන් තොග පිටින් මරා දැමීම, හැම්බර්ග්, ඩ්‍රෙස්ඩෙන් හා ටෝකියෝවට ගිනි බෝම්බ දැමීම හා හිරෝෂිමා නාගසාකි යන ජපන් නගරවලට පරමානු බෝම්බ හෙලීම ඉන් සමහරකි.

අද දින අපගේ කර්තව්‍යය වන්නේ යුද්ධයේ පාඩම් උකහා ගැනීමත් වර්තමානය සඳහා ඒවායේ වැදගත්කම මතුකර ගැනීමත් ය. දෙවන ලෝක සංග්‍රාමය, මතකයට සීමාවන හා විටින් විට සිහිපත් කරන දුරස්ත ඓතිහාසික සිද්ධියක් පමන ද? නැත්නම් එහි සමකාලීන අදාලත්වයක් ගැබ්වන්නේ ද?

යුද්ධයේ පාඩම් උපුටා ගැනීම සඳහා අපට යුද්ධයට තුඩුදුන් හේතු වටහා ගැනීම අවශ්‍යවේ. මෙහිදී යම් ප්‍රාරම්භක කටයුතු කිහිපයක් කල යුතුවේ. යුද්ධය වටා ගොතා තිබෙන මිත්‍යා හා ප්‍රබන්ධයන්හි ඝන වැස්ම කපාගෙන යාමට අපට සිදුවේ. සමකාලීන දේශපාලන න්‍යාය පත්‍රයන්ගේ සේවය සඳහා නිරතුරුව පෝෂනය කරන හා ප්‍රති නිර්මානය කරන මිත්‍යාවන් ඇත.

දැනට පැතිර ඇති ප්‍රබන්ධයන්ට අනුව, යුරෝපය තුල යුද්ධය ආරම්භ වූයේ, බ්‍රිතාන්‍ය, නාසි ජර්මනිය සංසිඳුවීමට දරන ලද උත්සාහය අසාර්ථකවීමෙන් පසුව 1939 සැප්තැම්බරයේ එරට පෝලන්තය ආක්‍රමනය කිරීමත් සමග, තමන් ස්ථාවරයක් ගත යුතු යයි අවසානයේදී බ්‍රිතාන්‍යට ඒත්තු යෑමෙන් පසුවය. එතැන් පටන් යුද්ධය, ෆැසිස්ට් ආක්‍රමනයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගලයක් විය. 1940 මැයි මාසයේදී ප්‍රන්සය වැටීමෙන් පසුව 1941 දෙසැම්බරයේ එක්සත් ජනපදය යුද්ධාවතීර්න වන තෙක් හුදෙකලාව පසුවූ මහා බ්‍රිතාන්‍යයේ, යුදකාලීන අගමැති ලෙස වින්ස්ටන් චර්චිල්, කුඩා දිවයින් වාසීන් "හොඳම පැයේදී" නාසිවාදයේ ආක්‍රමනික තර්ජනයට මුහුනපෑම සඳහා බලමුලු ගැන්වීය.

කාරනය නම් යුද්ධය ආරම්භ වන විට මහා බ්‍රිතාන්‍ය, පෘතුවි තලයෙන් හතරෙන් එකක්ම අත්කරගෙන සිටි හා ලෝකය කවර කලෙකවත් අත් නොදුටු තරමේ දැවැන්තම අධිරාජ්‍යයේ මුදුනෙහි සිටි අතර, මේ කථාව පහසුවෙන්ම බැහැර කර සිටියේය යන්නයි. චර්චිල්ගේ භූමිකාව සැලකීමේදී මිත්‍යාව තවදුරටත් ඔප නංවා ඇත. සංහිඳියාවේ ප්‍රතිපත්තිය අසාර්ථක වීමත් සමඟ, ප්‍රජාතන්ත්‍රවාදයේ නොපසුබට ආරක්ෂකයෙකු ද, නාසිවාදයේ හා ෆැසිස්ට්වාදයේ එවැනි ම විරුද්ධවාදියෙකු ද වූ චර්චිල්, බ්‍රිතාන්‍යයට අවශ්‍යම පැයේදී එහි පාලනය බාර ගැනීම සඳහා දේශපාලන වනගහනයෙන් ඉවතට කැඳවාගත් බව විශ්වාස කිරීමට අපව යොමුකර තිබේ.

අනෙකුත් සෑම ඓතිහාසික ප්‍රබන්ධයක් මෙන්ම මෙය ද තිරසාර වූයේ එය සමකාලීන දේශපාලන අරමුනු වෙනුවෙන් සේවය කල බැවින්ය. පසුගිය 20 වසර පුරාම මෙය භාවිතයට ගෙන ඇති ආකාරය බලන්න. 1990 ගල්ෆ් යුද්ධය දියත් කලේ ජනාධිපති සදාම් හුසේන් නමැති මැද පෙරදිග හිට්ලර් කුඩා කුවේටය ගිල දැමීම වැලැක්වීමටය. 1938 මියුනිච්හි පැවති හිට්ලර්ගේ සංහිඳියාව සිහිපත් කරගන්න. පසුව

1999 දී සර්බියාවට එරෙහි යුද්ධය දියත් කලේ සර්බියානු ජනාධිපති ස්ලොබොඩාන් මිලොසෙවික් කොසෝවෝ වරුන්ට එරෙහි ජනඝාතන ගෙන යමින් බෝල්කන්හි හිට්ලර් බවට පත්වීම වැලැක්වීමටය. 1938 සිහියට නගා ගන්න, 2003 දී එක්සත් ජනපදය ඉරාකයට එරෙහි යුද්ධය දියත් කරන විට මැද පෙරදිග හිට්ලර් යලි කරලියට පැමින සිටියේය.

1930 ගනන් වල සැබෑ තත්වය කුමක් වී ද?, ආඥාදායක හිට්ලර්ට එරෙහිව නැඟී සිට එය අසාර්ථකත්වයට පත්වීමේ ප්‍රතිපලය ලෙස සංහිඳියා ප්‍රතිපත්තිය පැමිනියා නොවේ. නිශ්චිත ගනන් බැලීම් කට්ටලයක් එයට සම්බන්ධව තිබුනි. නාසි තන්ත්‍රයට ඉඩ හැරීමේ බ්‍රිතාන්‍ය පිලිවෙත පදනම් වූයේ, මේන් කාම්ෆ් යන කෘතිය තුල හිට්ලර් ගෙනහැර දැක්වූ වැඩ පිලිවෙල අනුව යමින් ඔහු, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට වාසි ලබාගත හැකි පරිදි සෝවියට් සංගමයට එරෙහිව යුද්ධය දියත් කරනු ඇතැයි යන බලාපොරොත්තුව මතය. 1917 ඔක්තෝබර් විප්ලවයෙන් පසු දිනයේ සිට ම සෝවියට් තන්ත්‍රය පෙරලා දැමීමේ පිලිවෙත බ්‍රිතාන්‍ය විසින් අනුගමනය කර තිබුනි. මේ අරමුන වෙනුවෙන් චර්චිල් තරම් උද්යෝගිමත්ව සිටි වෙනත් අනුගාමිකයෙකු නොවූ තරම්ය. අධිරාජ්‍යවාදී බලවතුන් විසින් සිදුකරන මිලිටරි මැදිහත්වීමක් වෙනුවෙන් පෙනී සිටි ඔහු, "තොටිල්ලේදී ම බොල්ශෙවික් බිලිඳගේ ගෙල සිරකිරීම" සඳහා හඬනැඟීය.

මියුනිච්හි තැබෑරුම් වල මේස වලට තඩිබාන දක්ෂිනාංශික උන්මත්තකයෙකුට වැඩිමනත්ව හිට්ලර් ගැන නොදන්නා අවධියේ දී චර්චිල්, ආන්ඩුවේ ඇමති වරයෙක්ව සිටිමින් රුසියානු විප්ලවය හෙලා දැක්කේ පසු කාලයේදී නාසි තන්ත්‍රය විසින් පාවිච්චි කල භාෂාවෙන්ම ය.

1920 ප්‍රසිද්ධියට පත්කල ලිපියක් තුල "ජාත්‍යන්තර යුදෙව්වන්" ලෙස ඔහු විසින් නම් කරනු ලැබූ කොටසේ අන්තරායකාරී භූමිකාව පිලිබඳව චර්චිල් මෙසේ ලිවීය: "ඔවුන්ගේ වර්ගය නිසාම පීඩාවට පත් යුදෙව්වන් සිටින රටවල, අතෘප්තියට පත් ජනගහනය අතර, බොහෝ කොටම පිරිමින් වන මෙම දුෂ්ට ජන සමූහය, සිය ආසක්තයන් පිහිටුවාගෙන සිටිති. ඔවුන් සියල්ලන්ම නොවේ නම් බොහොමයක්, තම මුතුන් මිත්තන් පිලිබඳ විශ්වාසය භංග කරගෙන ඇති අතර, ඊලඟ ලෝකය පිලිබඳ අධ්‍යාත්මික බලාපොරොත්තුවලින් සිය මනස ඉවත්කර ගෙන සිටිති. යුදෙව්වන් අතර වන මෙම ව්‍යාපාරය අලුත් එකක් නොවේ. ස්පාටකස්-වේස්හොප්ට් ගේ කාලයේ පටන් කාල් මාක්ස්ගේ සිට ට්‍රොට්ස්කි, (රුසියානු), බෙලා කුන් (හංගේරියානු), රෝසා ලක්සම්බර්ග් (ජර්මානු) හා එමා ගෝල්ඩ්මන් (එක්සත් ජනපදය) දක්වා මෙය දිවයයි. ශිෂ්ඨාචාරය පෙරලා දමා, සංවර්ධනයේ ගෙල හිර කිරීමේ පදනම මත සමාජය ප්‍රති නිර්මානය කිරීම සඳහා, ඊර්ෂ්‍යා සහගත සතුරුකම හා අශක්‍ය වූ ගුනාංග සහිතව ලෝක පරිමාන වූ මෙම කුමන්ත්‍රනය, එක පැහැර වර්ධනය වී තිබේ. ප්‍රන්ස විප්ලවයේ ඛේදවාචකය පිලිබඳව ගත් කල එය, නිශ්චිතව ම හඳුනාගත හැකි භූමිකාවක් රඟ දැක්වීය. 19 වන සියවසේ සෑම කඩාකප්පල්කාරී ව්‍යාපාරයක ම ප්‍රධාන පිනුම් පිත්ත බවට පත්වූයේ එයයි. ඇමරිකාවේ හා යුරෝපයේ මහා නගරයන්හි පාතාලයෙන් නැඟී ආ අසාමාන්‍ය පුද්ගලිකත්වයන් සහිත මෙම කන්ඩායම දැන් අන්තිමේදී රුසියානු ජනතාවගේ කෙස් වල්ලෙන් අල්ලා ගෙන ඇති අතර, එම දැවැන්ත අධිරාජ්‍යයේ අනභියෝගී ස්වාමීන් බවට ප්‍රායෝගිකව ම පත්ව තිබේ."(1) යුදෙව්-බොල්ශෙවික් කුමන්ත්‍රනයට එරෙහි හිට්ලර්ගේ දෙඩවිලි වලින් ගුවන්විදුලියේ හා පුවත්පත් වල පිටු පිරී යන්නට බොහෝ කලකට පෙර, ***The Protocols of the Elders of Zion*** (සියොන්වාදී ප්‍රමුඛයන් පිලිබඳ කෙටුම්පත) නම් අතිශයින්ම කුප්‍රකට යුදෙව් විරෝධී පොත් පිංච නිකුත් කල එම වසරේදී ම චර්චිල් එම ප්‍රචාරය පෙරට ගැනීම අහම්බයක් නොවීය.

1922 වසරේ මුසෝලිනීගේ ෆැසිස්ට් තන්ත්‍රය බලයට පත්වූ ඉතාලියේ සංචාරයක යෙදෙන අතරතුර 1927 ජනවාරි 20 දින චර්චිල් කල කථාව තරම් වෙනත් කිසිවකින් ෆැසිස්ට්වාදය කෙරෙහි ඔහුගේ ආකල්පය පැහැදිලිව කැටිකර නොදක්වයි. "ඉමහත් බාධක හා අනතුරු මධ්‍යයේ තැන්පත්ව, නොසැලී සිටින මුසෝලිනී මහතාගේ සංසුන් භාවයෙන් ද, ඔහුගේ හුදු ඉවසීම ද හමුවේ, තවත් බොහෝ මිනිසුන් සිටින පරිද්දෙන් සංසුන් නොවී සිටින්නට මට නොහැකිය. දෙවනුව, ඔහු ඉතාලියේ ජනතාවගේ දිගු කාලීන යහ පැවැත්ම ගැන හැරෙන්නට වෙනත් කිසිවක් ගැන නොසිතන බව ඕනෑම කෙනෙකුට පෙනී යා යුතුය. මා ඉතාලියානුවෙකු වී නම්, ලෙනින්වාදයේ ලාලසාව හා මෘග කෑදරකමට එරෙහිව ඔබගේ ජයග්‍රාහී අරගලය ආරම්භයේ සිට අවසානය දක්වා මම මුලු හදින්ම ඔබ සමඟ සිටින බව මට විශ්වාසය. කෙසේ වෙතත් ෆැසිස්ට්වාදයේ ජාත්‍යන්තර දෘෂ්ටිය පිලිබඳව මා වචනයක් කිව යුතුය. බාහිර වශයෙන් ඔබගේ ව්‍යාපාරය සමස්ත ලෝකයටම සේවයක් සලසා ඇත. සෑම ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකුම හෝ කම්කරු පන්ති නායකයෙකුම හැම විටම නිමග්නව සිටින මහ ම භීතිය වන්නේ ඔහුට වඩා අන්තවාදී යමක් මගින් ඔහුට වලකපනු හෝ පරයා යනු ඇතැයි යන්නය. මහජනතාව රැලිකර ගැනීමේ හැකියාව සහිත කඩාකප්පල්කාරී බලවේගයන්ට එරෙහිව සටන් කිරීමේ මාවතක් තිබෙන බව ඉතාලිය විසින් මොනවට පෙන්නුම්කරදී ඇත. ඇය, ශිෂ්ඨ සමාජයේ ස්ථාවරත්වය හා ගෞරවය ආරක්ෂා කිරීමේ වටිනාකම හා අභිලාෂය සහිතව නියමාකාරයෙන් එය මෙහෙයවා තිබේ. ඇය රුසියානු විස නැසීමට අවශ්‍ය ඖෂධය සපයා ඇත. මින් පසුව

බොල්ශෙවික්වාදයේ පිලිකා කාරක වර්ධනයට එරෙහිව ආරක්ෂා වීමේ මාධ්‍යයන් කිසිදු බලවත් ජාතියකට හිඟ නොවනු ඇත." (2)

ජර්මනිය තුල මේ වන විට බලය කරා නගිමින් සිටි හිට්ලර් ද. බොල්ශෙවික්වාදයට එරෙහි ගැලවුම්කරුවා ලෙස මුසෝලිනීව බෙහෙවින් අගය කලේය. ප්‍රබන්ධය සඳහා බොහෝ කොටම යොදාගත්තේ ෆැසිස්ට්වාදයේ වර්ධනය වලක්වා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා යුද්ධය දියත් කලේය යන්නයි. නාසිවාදීන් සතුරන් බවට පත්වූයේ දිග් විජය සඳහා ඔවුන්ගේ තල්ලුව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ තත්වයට තර්ජනය කල තැන් පටන් පමනකි.

1941 දෙසැම්බර් 7 දා ජපන් ගුවන් හමුදාව පර්ල් වරායට බෝම්බ හෙලීමෙන් පසුව, එක්සත් ජනපදය යුද්ධාවතීර්නවූ තැනට අප පැමිනි කල, අපට තවත් ප්‍රබන්ධයක් හමුවෙයි. ජනාධිපති රූස්වෙල්ට් එදින ප්‍රකාශ කලේ "දුෂ්ටත්වය තුල ජීවත්වීම" යනුවෙනි. මෙහිදී අපට කියනු ලබන්නේ, එක්සත් ජනපදය යුද්ධයට පිවිසුනේ කිසිදු අධිරාජ්‍ය අභිලාෂයකින් හෝ සිය භූ දේශපාලනික ආසක්තයන් ඉටුකරගැනීමට නොවන බවයි. රූස්වෙල්ට්ගේ වචන ම යලි යොදාගන්නේ නම් එය, හුදෙක් "ජපානයේ බියගුලු හා කුලප්පු නොකල ප්‍රහාරයකට" දැක්වූ ප්‍රතිචාරයක් පමනි. සත්‍යයට දුරස්ත වෙනත් කිසිවක් නොමැති තරම්ය. ජපානයට එරෙහි යුද්ධය අපේක්ෂා කල හා කල් බලමින් සිටි දෙයකි. චීනයෙන් ඉවත්විය යුතුය යන එක්සත් ජනපදයේ ඉල්ලීම වෙනුවෙන් බලපෑම් යෙදීමේ අරමුනෙන් 1941 ජූලියේ එක්සත් ජනපදය විසින් ජපානයට එරෙහිව ඉන්ධන සම්බාධක පැනවීමෙන් පසුව යුද්ධයේ පැනනැගීම කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනක් විය. 1898 දී ලෝක බලවතෙකු වශයෙන් නැගී ආ තැන් පටන් එක්සත් ජනපදය, චීනය තුල "දොරටු විවර කර තැබීමේ" පිලිවෙත සඳහා බලපෑම් කලේය. පලමුව 1931 දී මැන්චූරියාව ආක්‍රමනය කිරීම හා ඉන් පසුව 1937 දී බීජිනය අල්ලා ගැනීම අරමුනු කර ගත් දෙවන යුද්ධය දියත් කිරීම ද වැනි, ජපානයේ කඩාවැදීම් කෙරෙහි එය දැක්වූයේ සතුරු කමකි.

පර්ල් වරායේ සිද්ධියට බෙහෝ කලකට පෙර සිට ම ජපානයට එරෙහි යුද්ධයක සැලසුම් කෙරෙහි එක්සත් ජනපදය ක්‍රියාත්මකව ම අවධානය යොමුකර තිබුනි. 1939 මාර්තුවේදී ඔරේන්ජ් මූලික යුද සැලැස්ම නමින් හැඳින්වූ තම යුද සැලැස්ම සඳහා සංශෝධනයක් එක්සත් ජනපද නාවික හමුදාව විසින් ඉදිරිපත් කොට තිබුනි. ඔරේන්ජ් යන්නෙන් හැඳින්වුනේ ජපානයයි. සැලැස්මට අනුව, ඔරේන්ජ් සමග යුද්ධයක් "පූර්ව දැනුම් දීමකින් තොර හදිසි" හා "කල් පවතින" ප්‍රහාරාත්මක යුද්ධයක් වනු ඇත. යුද සැලැස්මේ අරමුන වූයේ, "ඇමරිකාවේ ජාතික හා විදේශ අවශ්‍යතාවන් ආරක්ෂා කරන අතර, ඔරේන්ජ් සන්නද්ධ හමුදා විනාශ කර දැමීම හා එහි ආර්ථික ජීවිතය කඩාකප්පල් කර දමා ඔරේන්ජ් මත එක්සත් ජනපද අභිමතය පැටවීමයි." (3)

1940 සැප්තැම්බරයේදී ටෝකියෝහි එක්සත් ජනපද නාවික හමුදා සහායකයා ජපාන නගරවල තත්වය පිලිබඳව වොෂින්ටනය වෙත වාර්තාවක් ඉදිරිපත් කලේය. "නිවාස පැරනි, ගරාවැටුනු හා තෙත බරිතය. ජල මූලාශ්‍ර රාත්‍රී කාලයේදී වසා දැමෙයි. ජලය ගලන්නේ යාන්තමිනි. ගිනි නිවීමේ ජල මූලාශ්‍ර අල්පයකි. එකිනෙකට දුරින් පිහිටා ඇත. ජපන් නගර ආශ්‍රිතව පුලුල් ලෙස ගිනි බෝම්බ වැපිරීමේ ප්‍රතිඵලය වනු ඇත්තේ එම නගරවල විශාල ප්‍රදේශයන් වැනසී යාමයි." (4) මෙම උපදේශය 1945 මාර්තුවල ටෝකියෝවට ගිනි බෝම්බ හෙලීමත් සමග මාරාන්තික බලපෑමක් ඇති කලේය. ඉන් පසුව ඇතිවූ ගිනි කුනාටුවෙන් ලක්ෂයකට අධික මිනිසුන් මිය ගිය බවට ගනන් බලා තිබේ. එය, හිරෝෂිමා හා නාගසාකි වෙත හෙලූ පරමානු බෝම්බ වලින් ක්ෂනිකව සිදුවූ මරන සංඛ්‍යාවට වඩා විශාල විය. එක්සත් ජනපදයේ නිල මූලෝපායික බෝම්බ සමීක්ෂනයකින් නිගමනය කල පරිදි "ටෝකියෝවේ ගින්නෙන් පැය හයක කාලය තුල ජීවිත විනාශවූ මිනිසුන් සංඛ්‍යාව මිනිස් ඉතිහාසයේ කුමන හෝ එක් අවස්ථාවකදී සිදුවූ විනාශයට වඩා අධිකය." (5)

මිත්‍යා හා ප්‍රබන්ධ හරහා මාවතක් හෙලිකර ගැනීමෙන් පසුව දැන් අපි දෙවන ලෝක සංග්‍රාමයට තුඩු දුන් හේතු සොයා බලමු. ඒවා හෙලිදරව් කරගත හැක්කේ, 1930 ගනන් අවසානයේ ක්ෂනික සිදුවීම් හා ගැටුම් වලට වඩා දුර දිග යන ඓතිහාසික විශ්ලේෂනයක පදනම මත පමනි. එම ගැටුම් හා සිදුවීම් හටගත් පසුබිම ම පැහැදිලි කල යුතුය.

දෙවන ලෝක යුද්ධයට හේතු පිලිබඳ කුමන හෝ විමසීමක් ඇරඹිය යුත්තේ, එය, පලමු ලෝක යුද්ධාවසානයෙන් යන්තම් 21 වසරකට පසුව හටගත්තේය යන කාරනයෙනි. එනම්, අද දින සිට බර්ලින් තාප්පය බිඳවැටීම දක්වාත්, නැගෙනහිර යුරෝපීය තන්ත්‍රයන් හා සෝවියට් සංගමය බිඳ වැටීම දක්වාත් ගතව ඇති කාලයට සමාන කාලයක්ය යන්නයි.

1914 අගෝස්තු 4 දින පුපුරා ගිය යුද්ධය දැවැන්ත කම්පනයක් ඇති කලේය. 1914 ජූනි 28 දින සරයේවෝහි දී ඔස්ට්‍රියානු ජාතික ආදිපාද ෆර්ඩිනන්ඩ්ගේ ඝාතනය, පෙර අත් නොදුටු පරිමානයේ මනුෂ්‍ය ඝාතනයක් හා විනාශයක් ඇති කරමින් යුරෝපා මහාද්වීපය සිව් වසරක ගැටුමකට ඇද දමන සිදුවීම්

වැලක ආරම්භය වනු ඇතැයි අනුමාන කලේ කිහිප දෙනෙක් පමනි.

කෙසේ වෙතත්, පොදු යුරෝපීය යුද්ධයක ස්වභාවය කෙසේ වනු ඇත්ද යනු ඒත්තු ගත් තියුනු පෙරදැකීමකින් යුත් නිරීක්ෂකයන් නොසිටියේ නොවේ. 1887 වසර අවසානයේ ෆ්‍රෙඩ්‍රික් එංගල්ස් මෙසේ ලිවීය. "අවසානයේදී ප්‍රුසියා-ජර්මනියට කිරීමට ඉතිරිව ඇති යුද්ධය ලෝක යුද්ධයක් පමනක් වනු ඇත. තව ද, ඒ දක්වා එහි පරිමානය හා ප්‍රචන්ඩත්වය සිතිය නොහැකි තරම් වනු ඇත. එකිනෙකාගේ බෙල්ලට පනින මිලියන අටත් දහයත් අතර සොල්දාදුවෝ යුද ක්‍රියාවලිය තුලදී ලෝකස්ට් කෘමීන්ගෙන් ගහන මුඩු බිමක් ලෙස දිස්වන තෙක් යුරෝපය නිරුවත් කරනු ඇත. තිස් අවුරුදු යුද්ධයේ විනාශය වසර තුනක් හෝ හතරක් තුලට හකුලුවා සමස්ත මහාද්වීපය පුරාම පතුරුවාලනු ඇත. සාගතය, වසංගත සමග දෙපාර්ශවයේම හමුදා හා මහජනතාව යන දෙකොට්ඨාශයම ම්ලේච්ඡත්වයේ ලෝකයක් තුලට ඇද දමනු ඇත. වෙලඳාම, කර්මාන්ත හා නය පිලිබඳ අපගේ කෘතීම පද්ධතියේ පිලිසකර කල නොහැකි බිඳී යාම අවසන්වනු ඇත්තේ සාර්වත්‍රික බංකොලොත් භාවයකිනි. පැරනි රාජ්‍යයන්ගේ හා ඒවායේ ලෝක සම්මත දේශපාලන ප්‍රඥාව බිඳවැටෙද්දී, දූසිම් ගනන් කිරීට කානු පත්ලට පෙරලී යන හා ඒවා ඇහිඳගැනීමට කිසිවෙකුත් නොමැති තත්වයක් උද්ගත කරනු ඇත. ඒ සියල්ල අවසන් වන්නේ කෙසේදැයි හා සංග්‍රාමයේ ජයග්‍රාහකයා ලෙස මතු වන්නේ කවරෙක් දැයි පෙර දැකීම පරම වශයෙන්ම කල නොහැක්කක් බවට පත්වෙයි. එක් ප්‍රතිවිපාකයක් පමනක් පරම වශයෙන්ම නිශ්චිතය. විශ්වීය නිරවශේෂනය හා කම්කරු පන්තියේ අවසාන ජයග්‍රහනය සඳහා මෙයින් කොන්දේසි නිර්මානය කරනු ඇත. අවි ආයුධ කෙරෙහි වන අන්‍යොන්‍ය මනෝභාවයේ ක්‍රමානුකූල වර්ධනය එහි මුදුනට ම ලඟාවන විට හා අවසානයේදී එහි අනිවාර්ය ප්‍රතිපල අත්කර දෙන විට ඒ මොහොත සඳහා ඇති බලාපොරොත්තුව එයයි."

19 වන සියවසේ අවසන් දශකයන්හි ආර්ථිකයේ හා ඒ නිසාම මිලිටරි ශක්තියේ වේගවත් ප්‍රසාරනයක් සිදුවූ ධනේශ්වර ජාතික-රාජ්‍යයන් අතර යුද්ධයේ අවස්ථාවන් එංගල්ස් එහිදී පෙන්වා දෙයි.

ධනේශ්වර කර්මාන්ත හා මූල්‍යය ඉමහත් පරිමාවකින් වර්ධනය වෙමින් තිබුනි. ධනේශ්වර මහා බලවතුන් වෙලඳපොලවල්, යටත් විජිත, බල වැයික්කි හා අමුද්‍රව්‍ය සඳහා ගෝලීය පරිමානයෙන් එන්ට එන්ටම තීව්‍ර වන්නාවූ අරගලයක යෙදී සිටීම හමුවේ, අධිරාජ්‍යවාදී අවධියක ආරම්භය සිදු විය. මෙම ආර්ථික මාරුව පවත්නා හු දේශපාලනික සම්බන්ධතා සමග වඩ වඩාත් ගැටුමට එලඹුනේය.

1815 දී නැපෝලියන්ගේ පරාජයෙන් පසුව බ්‍රිතාන්‍ය සංහිඳියාවක් වැනි දෙයක් පැවති අතර, යුරෝපීය බලවතුන් අතර පොදුවේ ගැටුම් හටගත්තේ නැත. එහෙත් 19 සියවස අවසානය කරා ලඟාවන විට මහා බ්‍රිතාන්‍යයට එය සතුව පැවති පූර්න අධිකාරී තත්වය නැතිවෙමින් තිබුනි. පූර්වයෙන් යුරෝපීය මහාද්වීපය තුල බ්‍රිතාන්‍යයට ගැටුම් පැවතියේ ප්‍රන්සය සමග ය. දැන් වඩාත් ගතික හා නව බලයක් වන ජර්මනිය ඊට අභියෝග කරන්නට පටන් ගෙන තිබුනි. නැගෙනහිර දෙසින් ජපානය නැගී එමින් තිබුනු අතර බටහිරෙන් වඩාත් සවිමත් ආර්ථික බලවතෙකු, එනම්, එක්සත් ජනපදය, 1865 සිවිල් යුද්ධයේ නිමාවෙන් පසුව එලඹි දශකයන්හි යෝධ පියවරයන්ගෙන් කාර්මික වර්ධනයක් අත් විඳිමින්, නැගී ආවේය.

මාක්ස්වාදී ව්‍යාපාරය අලුත් තත්වයේ ඇඟවුම් විශ්ලේෂනය කල අතර 1889 වසරේදී පිහිටුවන ලද දෙවන ජාත්‍යන්තරය, යුද්ධය පිලිබඳව මතුවෙමින් පැවති තර්ජනය පෙන්වා දෙමින් 20 සියවසේ පලමු දශකය තුල යෝජනා මාලාවක් සම්මත කලේය. යුද්ධය දෙසට යන තල්ලුවට සමාජවාදී ව්‍යාපාරය විරුද්ධ විය යුතු බවත්, යම් හෙයකින් එය වැලැක්වීමට අපොහොසත් වුව හොත්, යුද්ධය හටගැනීමෙන් නිර්මානය කල අර්බුදය, ධනේශ්වර පද්ධතිය පෙරලා දැමීම සඳහා උපයෝගී කරගත යුතු බවත්, මෙම යෝජනා තුල අවධාරනය කරනු ලැබුවේ ය. කෙසේ වෙතත් 1914 අගෝස්තු 4 දින යුද්ධය පුපුරා යාමත් සමග, පැරනි සමාජවාදී පක්ෂවල සමස්ත නායකත්වය ම පාහේ එම යෝජනාවලිය පාවා දෙමින් තමන්ගේ ම ධනේශ්වරයට සහාය පලකලහ. සමාජවාදී නායකයන් අතුරෙන් ලෙනින්, ට්‍රොට්ස්කි හා ලක්සම්බර්ග් ඇතුලු අතලොස්සක් දෙනා පමනක් යුද්ධයට එරෙහි සිය ස්ථාවරය එලෙස ම පවත්වාගෙන ගියහ.

ජාත්‍යන්තර සමාජවාදයේ මෙම පාවාදීමෙන් පසුව, විප්ලවවාදී මාක්ස්වාදීහු අන්තර් සම්බන්ධිත දේශපාලන කර්තව්‍යයන් දෙකක් සමග පොරබැදූහ. ඒ, යුද්ධය පැනනැගීමට තුඩුදුන් කරුනු හා දෙවන ජාත්‍යන්තරය බිඳවැටීමේ හේතු හා ඒවායේ ඇඟවුම් පැහැදිලි කිරීම හා මෙම විශ්ලේෂනයේ පදනම මත කම්කරු පන්තිය සඳහා විප්ලවවාදී ඉදිරිදර්ශනයක් විස්තාරනය කිරීමත් ය.

1915 දී ට්‍රොට්ස්කි, *War and the International* (යුද්ධය හා ජාත්‍යන්තරය) යන සිය විශිෂ්ඨ පොත් පිංච තුල යුද්ධයේ අනිවාර්ය හේතු ගෙනහැර දැක්වීය. අධිරාජ්‍යවාදී දේශපාලඥයන් විසින් ඉදිරිපත් කල හේතු දැක්වීම් ප්‍රතික්ෂේප කරමින් හා ඔවුන්ගේ වංචනික අරමුනු හෙලිදරව් කරමින් ඔහු, යුද්ධය පැනනැගීම මුල්බැස ඇත්තේ ධනේශ්වර නිෂ්පාදන මාධ්‍යයන්ගේ

ඓන්ද්‍රීය හා නොවිසඳිය හැකි ප්‍රතිවිරෝධයන් තුල බව පෙන්වා දුන්නේය.

"වර්තමාන යුද්ධය වනාහි, ජාතියේ හා රාජ්‍යයේ දේශපාලන ආකෘතියට එරෙහිව නිෂ්පාදන බලවේගවල පතුලෙන්ම නැගී ආ කැරැල්ලකි. එහි අර්ථය වන්නේ, ස්වාධීන ආර්ථික ඒකකයක් වශයෙන් ගත් කල ජාතික රාජ්‍යයේ බිඳවැටීමයි. යුද්ධය, ජාතික රාජ්‍යයේ ඇද වැටීම ප්‍රකාශයට පත්කලේය. ඒ සමග ම එය, ආර්ථිකය පිලිබඳ ධනේශ්වර ක්‍රමයේ ඇද වැටීම ද නිවේදනය කලේය. ජාතික රාජ්‍යය මාධ්‍ය කරගත් ධනවාදය සමස්ත ලෝක ආර්ථිකයේම විප්ලවයක් ඇති කලේය. එය, මහා බලවතුන්ගේ කතිපයාධිකාරයන් අතර සමස්ත මිහි තලයම බෙදා හලේය. එය, ලොකු බලයන්ගේ එදිරිවාදිකම් මධ්‍යයේ පැවති කුඩා ජාතීන් ද උපග්‍රාහයන් ද තමන් වටා රැලිකර ගත්තේය. අනාගතයේදී ලෝක ආර්ථිකය ධනේශ්වර පදනම මත වර්ධනය වීමේ අර්ථය වන්නේ, ධනේශ්වර සූරාකෑම සඳහා එකම හා එම මූලාශ්‍රයම වන පෘතුවියෙන්, අලුත් හා තව තවත් අලුත් ක්ෂේත්‍රයන් අත්කර ගැනීම සඳහා වන නිමක් නැති අරගලයකි. මිලිටරිවාදයේ බැනරය යටතේ වන ආර්ථික එදිරිවාදිකම් සමග, මානව ආර්ථිකයේ ඉතාමත් ප්‍රාථමික මූලධර්මයන් පවා උල්ලංඝනය කරන කොල්ලකෑම හා විනාශය අත්වැල් බැඳ ගනියි. ලෝක නිෂ්පාදනය කැරලි ගසන්නේ ජාතික හා රාජ්‍ය බෙදීම් මඟින් උද්ගත කල ව්‍යාකූලත්වයට එරෙහිව පමනක් නොව, දැන් ම්ලේච්ඡ අරාජිකත්වයකට හා ව්‍යසනයකට ඇද දමා තිබෙන ධනේශ්වර ආර්ථික සංවිධානයන්ටත් එරෙහිව ය."

මෙම විශ්ලේෂනයෙන්, ජාත්‍යන්තර කම්කරු පන්තිය දැන් සටන් වැදිය යුතු ක්‍රියාමාර්ගයේ පදනම සකස් කරන ඉතා නිශ්චිත දේශපාලන නිගමනයන් ගලා එයි. "නිර්ධන පන්තියට, ධනවාදයේ අධිරාජ්‍යවාදී පටලැවිල්ලට මුහුන දිය හැකි එකම ක්‍රමය වන්නේ, ලෝක ආර්ථිකය සමාජවාදී ආකාරයකට සංවිධානය කිරීම සඳහා වූ දිනයේ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් සමඟින් එයට විරුද්ධත්වය දැක්වීම පමනි. යුද්ධය වනාහි, ධනවාදය එහි සංවර්ධනයේ ඉහලම අදියරේදී එහි නොවිසඳියහැකි ප්‍රතිවිරෝධයන් විසඳගැනීමට යොදාගන්නා විධික්‍රමයයි. මෙම ක්‍රමවේදයට, කම්කරු පන්තිය සමාජවාදී විප්ලවය නමැති තමන්ගේ ම විධික්‍රමයෙන් විරුද්ධ විය යුතුය."

දෙවන ජාත්‍යන්තරයේ බිඳවැටීමෙන් ඉස්මතු කරනු ලැබුවේ, රුසියානු බොල්ශෙවික් පක්ෂය ගොඩනැඟීමේ ව්‍යායාමය තුල, ලෙනින් අවස්ථාවාදයට එරෙහිව කල දිග් ගැස්සුනු අරගලයේ වැදගත් කමයි. ධනේශ්වරයට හා ජාතික රාජ්‍යයට අනුගත වීමේ පදනමෙන් ගත් කල අවස්ථාවාදය, කෙසේ හෝ ඒ සමග සාමකාමී සහජීවනයෙන් යුතුව පැවතීම සඳහා වූ, සමාජවාදී ව්‍යාපාරයේ ප්‍රවනතාවක් නොවේ. කම්කරු පන්තියේ දේශපාලන සූදානම ඇතිකර ගන්නේ, ධනපති පන්තියේම ගැඹුරු ආසක්තයන් හා අරමුනු වෙනුවෙන් පෙනී සිටින මෙම ප්‍රවනතාවන්ට එරෙහි අශමනීය අරගලයක් තුලිනි.

ලෙනින්ගේ ඉදිරිදර්ශනය වූයේ අධිරාජ්‍යවාදී යුද්ධය සිවිල් යුද්ධයක් බවට හැරවිය යුතුය යන්නයි. එයින් අදහස් කලේ වෛෂයික තත්වය කුමක් වුවත්, කම්කරු පන්තියට වහාම බලය සඳහා අරගලයේ නැඟිටීමක් දියත් කල හැකිය යන්න නොව, ඔවුන් මේ මාවත ඔස්සේ පෙරට යා යුතු බවයි. යුද්ධය ඉස්මතු කලේ, දෙවන ජාත්‍යන්තරයේ මූලික ප්‍රවනතාවන් තුල අර්ථ දැක්වූ පරිදි සමාජවාදී විප්ලවය ඈත අනාගතයේ කිසියම් වර්ගයක සිදුවීමක් නොව, පක්ෂයේ දෛනික අරගලය තුල ක්‍රියාත්මකව සූදානම් කල යුතු දෙයක් වන බවය. සියල්ලටමත් වඩා ලෙනින් විරුද්ධ වූයේ කාල් කවුට්ස්කිගේ න්‍යායන්ටය. ඔහු ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ න්‍යායවාදියා විය. ඔහු කියා සිටියේ, යුද්ධය වනාහි ධනවාදයේ නොවැලැක්විය හැකි ප්‍රතිඵලයක් නොවන බවත්, ඒ නිසාම ප්‍රධාන ධනේශ්වර බලවතුන්ට ලෝකය සාමකාමීව බෙදාගැනීම මගින් සාමය ඇති කිරීම සඳහා කෙසේ හෝ එකඟත්වයකට පැමිනිය හැකි බවත් ය.

සමකාලීන අදාලත්වයක් ද දරන අතිශය කැපී පෙනෙන විශ්ලේෂනයක් කරමින් ලෙනින්, ඔවුන්ගේ කියාපෑම් ප්‍රතික්ෂේප කලේ, ධනේශ්වර බලවතුන් අතර කිසිදු සන්ධානයක් ස්ථිරසාර නොවිය හැක්කේ ඒවා අසමාන අනුපාතයකට අනුව ගොඩනැගෙන නිසා බව අවධාරනය කරමිනි. අඩ සියවසකට පෙර ජර්මනිය, ධනවාදී හයි හත්තිය අතින් බ්‍රිතාන්‍ය සමග සසඳන කල "නොවැදගත් කාලකන්නි රටක්" විය. දැන් ජර්මනිය පැරනි අධිරාජ්‍යයට අභියෝග කරමින් සිටියි. එසේම අනාගතයේදී ඇතිකර ගන්නා ඕනෑම "සාමයක්" අනිවාර්යයෙන්ම කඩාකප්පල් වනු ඇත. කෙසේ වෙතත්, යුද්ධයන් අතර අවධියක දී නොවැලැක්විය හැකි ලෙසම, මොනම අධිරාජ්‍යවාදී සන්ධානයකට හෝ සහාගයකට ස්ථාවරත්වයක් අත්කර ගත හැකි නොවේ. යුද්ධයන් තුලින් සාමයේ අවධීන් උදාවන නමුත්, එම සාමයන් අලුත් යුද්ධ සඳහා පසුබිම සකස් කරයි. සමාජවාදී විප්ලවය ම හා ධනේශ්වර ක්‍රමය පෙරලා දැමීම ම පමනක් යුද්ධය හා එය මානව ශිෂ්ඨාචාරයට එල්ල කරන තර්ජනය අවසන් කිරීමට සමත් වෙයි.

## වර්සායි ගිවිසුම හා එහි ප්‍රතිවිපාකයෝ

ලෙනින්ගේ ප්‍රවිෂ්ටයේ පදනම මත, නොවැලැක්විය හැකි ලෙසම දෙවන ලෝක සංග්‍රාමය

පුපුරා යාමට තුඩු දුන් ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් පසුව "සාමය" ඇතිකලේ කෙසේ දැයි අපි විභාග කර බලමු.

ජර්මානු ගිම්හාන ආක්‍රමනය පරාජය වීමෙන් පසුව 1918 නොවැම්බරයේ යුද්ධය හදිසි අවසානයකට පැමිනියේය. 1917 අප්‍රේල් මාසයේදී එක්සත් ජනපදය යුද්ධයට මෙහෙයවූ ඇමරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන් මගින් සාමයක් ඇති කිරීමට ජර්මානු හමුදා ආඥාපතිත්වය තීරනය කලේය. 1917 ඔක්තෝබර් විප්ලවය හා යුරෝපය සිසාරා නැගී ආ විප්ලවවාදී උදම් රැල්ල, 1918 වන විට දේශපාලන තත්වයේ වැදගත් නව සාධකයක් බවට පත් විය. යුරෝපයේ සියලු ධනපති නායකයන්ගේ උපරිම ගනන් බැලීම් පිලිබිඹු කලේ, ඔවුන් යුද්ධය අවසාන නොකල හොත්, සමාජවාදී විප්ලවය මගින් එය අවසානයකට ගෙන එනු ඇති බවට පලවූ භීතියයි.

1919 වර්සායි සාම සමුලුව හා එහි ප්‍රතිඵලය වූ ගිවිසුම, යුද්ධය පුපුරා යාමට තුඩු දුන් කිසිදු ගැටුමක් විසඳුවේ නැත. සැබවින්ම සිදු වූයේ එමගින් ගැටුම් තවත් තියුනු කිරීම පමනි. ජාතික විසංවාදයන් හා ගැටුම් ඉතිරිව තිබුනු අතර, යුරෝපීය ආර්ථිකය බුද්ධිමත් ලෙස සංවිධානය කිරීම වෙනුවට සිදුවූයේ ප්‍රධාන බලවතුන් අතර ආර්ථික ගැටුම් උත්සන්න කිරීමයි. කොල්ලකෑමේ හා සොරකමේ නව පද්ධතියකින් යුද්ධය විස්ථාපනය කෙරුනි. ජර්මනිය පක්ෂඝාත කරන යුද වන්දි ගෙවන ලෙසට ප්‍රන්සය බලපෑම් කලේ එරට ආර්ථික පුනර්ජීවනයක් ඇතිවීම වැලැක්වීමේ අරමුනෙන්ය. බ්‍රිතාන්‍ය, ඉතාලියෙන් හා ප්‍රන්සයෙන් මුදල් අත්කර ගත්තේය. අනෙක් අතට එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය විසින් තමන්ට ගෙවිය යුතුව තිබුනු මුදල් ඉල්ලා බල කලේය. යුද වන්දිවල රූපයෙන් ජර්මනියෙන් මුදල් ඇදගනු ලැබිනි. ඒවා බ්‍රිතාන්‍යයට හා ප්‍රන්සයට ගෙවීම සඳහා පාවිච්චි කල අතර, අනෙක් අතට එම මුදල්, එක්සත් ජනපදයේ නය වෙනුවෙන් හිලව් කරන ලදී. 1924 පසුව එක්සත් ජනපදය අනෙක් අතට, යුද වන්දි ගෙවීමටත් මූල්‍ය පරිපථය පවත්වාගෙන යාමටත් ජර්මනියට ඉඩ සැලසෙන පරිදි එහි ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා බිලියන ගනන් ඩොලර් නය නිකුත් කලේය. බ්‍රිතාන්‍ය අර්ථශාස්ත්‍රඥ ජෝන් මේනාඩ් කේන්ස්ගේ වචන වලට අනුව ලෝකය, ආර්ථික පිස්සන් කෙටුවක් බවට පත්කොට තිබුනි.

(කවුරුත් සිනහවන්නට පටන් ගැනීමට පෙර, 2007-08 අර්බුදය මධ්‍යයේ ගෝලීය මූල්‍ය පද්ධතිය තිරසාර කිරීමට ද යොදාගනු ලැබුවේ ඊට නොඅඩු උමතු ක්‍රමවේදයන් බව මවිසින් පෙන්වා දිය යුතුය. එක්සත් ජනපද ෆෙඩරල් මහ බැංකුව බැංකු වලට මුදල් නිකුත් කලේ බිංදුවට ම ආසන්න පොලියකටය. බැංකු මෙම මුදල් නිතරම පාහේ යොදා ගත්තේ, එම බැංකුවලට ම හා අනෙකුත් මූල්‍යායතන වලට ඇප දීම සඳහා අරමුදල් යෙදවීමෙන් නයගැතිවූ ආන්ඩුවේ මූල්‍ය සම්පාදනය සංවිධානය කිරීමටය. එය සිදු වූයේ බැඳුම්කර හා නය වෙලඳපොල තුල වෙලඳ ගනුදෙනු තුලිනි. එහි ප්‍රතිඵල වශයෙන් බැංකු වලට, ඉහල ලාභ වාර්තා කිරීමටත් අත දිගහැර පාරිතෝෂික ගෙවීමටත් හැකියාව ලබා දුන්නේය.)

ප්‍රධාන යුරෝපීය බලවතුන්, සාමයේ අවසාන වර්ෂය වූ 1913 වාර්තා කල ආර්ථික නිමැවුමේ මට්ටම් යලි අත්කර ගැනීමෙන් යන්තම් දෙවසරකට පසුව එනම්, වර්සායි ගිවිසුමෙන් දශකයකට පසුව, එම ආර්ථික කාඩ්බෝඩ් නිවස බිඳ වැටුනේ, ලෝක ආර්ථිකය මහා අවපාතය තුලට ඇද හෙලමිනි. ධනේශ්වර මහා බලවතුන් අතර ඊලඟට ගොඩනැගුනු ආර්ථික ආතතීන්, යුද්ධය සඳහා තල්ලුව සැපයීය.

1939 දී පුපුරා ගිය යුද්ධය තුල ඉස්මතුවූ සෑම ප්‍රධාන ප්‍රතිමල්ලවයෙකුට ම, ආරක්ෂා කිරීමට හා පෙරට ගෙනයාමට බලගතු අවශ්‍යතාවන් පැවතුනේය. එම ආසක්තයන් නොවැලැක්විය හැකි පරිදි ම එකිනෙක සමග ගැටුමට මුලපිරීය. ඊලඟට අපි ඒවා එකින් එක සැලකිල්ලට බඳුන් කරමු.

ජර්මනිය සම්බන්ධයෙන් ලෝක ආර්ථිකයේ බිඳවැටීමෙහි අර්ථය වූයේ, මිලිටරි දිග් විජය යලි වතාවක් න්‍යාය පත්‍රය මත තැබිය යුතුය යන්නයි. Lebensraum (හුස්ම ගැනීමේ ඉඩක්) ධර්මතාව තුල සංගෘහිත වූයේ හිට්ලර්ගේ හා නාසි පක්ෂයේ එම ක්‍රියාමාර්ගයයි. ලෝක ආර්ථිකය මත බ්‍රිතාන්‍ය සමග තරගයක් තුලින්, ජර්මානු අවශ්‍යතා පෙරට ගෙනයාමට දරන උත්සාහය නිශ්ඵල බව හිට්ලර් සැලකිල්ලට ගත්තේය. බ්‍රිතාන්‍ය සමග සම්මුතියකට ඒමට කැමැත්ත පල කල ද හිට්ලර් වඩාත් කනස්සල්ලට පත්වූයේ එක්සත් ජනපදය පිලිබඳවය. ඒවන විටත් ජර්මනිය තුල තම පූර්ව යුද්ධ දේශ සීමා යලි පිහිටුවීම සඳහා උද්ඝෝෂනයක් ආරම්භවී තිබුනි. වර්සායි ගිවිසුමේ ප්‍රතිපලයක් වශයෙන් ජර්මනියට සැලකිය යුතු භූමිභාගයක් අහිමිවී තිබුනි. එහෙත් හිට්ලර්ට නම් එපමනකින් සෑහීමට පත් විය නොහැකි විය. එම බිම් කොටස් යලි ලබා ගත්තත්, සියල්ලටත් වඩා මෝටර් රථ කර්මාන්තය නියෝජනය කල වර්ධනය තුලින් ආර්ථික ප්‍රමුඛත්වයට පත්ව සිටි එක්සත් ජනපදය සමග තරගයේදී ජර්මානු ආර්ථිකය කුඩා එකක් විය.

ප්‍රසිද්ධියට පත් නොකල තම දෙවන ග්‍රන්ථය තුල හිට්ලර්, සිය ඉදිරිදර්ශනය මෙසේ ගෙනහැර දැක්වීය: "අපනයන ජාතීන් ලෙස ලෝක වෙලඳපොල සඳහා අරගලයක යෙදී සිටින සියලු යුරෝපීය රටවල්, ඊට අමතරව, බොහෝ ක්ෂේත්‍රයන්හි දී දැන් තියුනු තරගකරුවෙක් බවට පත්ව සිටින ඇමරිකානු සංගමයට ද මුහුන දී සිටියි. එහි අභ්‍යන්තර වෙලඳපෙලේ ප්‍රමානය

හා සෞභාග්‍යය, නිෂ්පාදනයේ පිරිවැය එතරම්ම පහතට ගෙන ඒමට හැකිවන පරිදි නිෂ්පාදන මට්ටම්වලට හා එබැවින් නිෂ්පාදන පහසුකම්වලට ඉඩ සලසා තිබේ. එහි ඉහල වේතන තිබිය දී වුවත්, අඩු මිලට විකිනීම තව දුරටත් කල හැක්කක් නොවේ. ඇමරිකානු අභ්‍යන්තර වෙලඳපොලේ ප්‍රමානය හා එහි මිලට ගැනීමේ ශක්තිය මෙන්ම අමුද්‍රව්‍ය ද, ඇමරිකානු මෝටර් රථ කර්මාන්තයට අභ්‍යන්තර වෙලඳපොලක් සහතික කරයි. යුරෝපයේ අභ්‍යන්තර වෙලඳපොල අවස්ථාවන්හි හිඟකම, නිෂ්පාදන ශිල්පි ක්‍රම යොදාගැනීම සරලව ම නොකල හැකි දෙයක් බවට පත්කර ඇත. එසේ වන බැවින් ඇමරිකානු ආර්ථික තර්ජනයට මුහුන දිය හැක්කේ ප්‍රමානයෙන් ඒතරමට ම විශාල වන වෙලඳපොලකට පමනි."

විධිමත් ඒකාබද්ධතාවක් සඳහා වන යුරෝපීය සාම ව්‍යාපාරයකට, එක්සත් ජනපදයේ බලයට මුහුන දිය නොහැකිවනු ඇතැයි හිට්ලර් අවධාරනය කලේය. යුරෝපීය ඒකාබද්ධතාවය සාක්ෂාත් කල යුත්තේ අධිකාරවත් ජාතියකගේ එනම්, ජර්මනියේ නායකත්වය යටතේය. ඔහු මෙසේ ලිවීය. "අනාගතයේදී උතුරු ඇමරිකාවට අභියෝගයක් ලෙස නැගී සිටිය හැකි රාජ්‍යය වනු ඇත්තේ, තම අභ්‍යන්තර ජීවිතයේ ස්වභාවය තුලින් මෙන්ම එහි විදේශ ප්‍රතිපත්තියේ මූලද්‍රව්‍යයන් තුලින් ද සිය ජනතාවගේ වාර්ගික වටිනාකම් නගාලීම හා එය මෙම කර්තව්‍ය සඳහා ප්‍රායෝගික ජාතික ආකෘතියක් තුලට ගෙන එන්නේ කෙසේදැයි අවබෝධ කරගත් රාජ්‍යයට පමනි. මෙම කර්තව්‍ය සඳහා හැකි ඉහලම මට්ටමකට අපගේ පීතෘ භූමිය සූදානම් කර ශක්තිමත් කිරීම, ජාතික සමාජවාදී ව්‍යාපාරයේ වගකීම වෙයි." (6) ලෝක බලවතෙකුගේ තත්වයට ජර්මනිය ඔසවා තැබීමේ අරමුන සහිත මිලිටරි විජයග්‍රහනය තුලින් අත්කරගත් Lebensraum (භූස්ම ගැනීමේ ඉඩක්) ධර්මතාවය සොයාගත්තේ හිට්ලර් නොවේ. එය ජර්මානු ධනේශ්වරයේ තීරනාත්මක කොටසකගේ ක්‍රියාමාර්ගය විය. එය අලුතෙන් උපත ලත් සෝවියට් සංගමය මත 1918 දී පටවන ලද්දකි. ඒ අනුව, බ්‍රෙස්ට්ලිටෝව්ස්ක් ගිවිසුම යටතේ ජර්මනියට, යුක්රේනයේ හා රුසියාවේ සම්පත් බහුල විශාල ප්‍රදේශයක් සූරා කෑමට ඉඩ සැලසුනි.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය, සිය අවශ්‍යතා ඉටුකර ගැනීමේදී නිර්දය භාවය අතින් ජර්මනියට දෙවෙනි වූයේ නොවේ. තීරනාත්මක වෙනස වූයේ, බ්‍රිතාන්‍යයේ ගෝලීය ආර්ථික හා මිලිටරි බලය ඒ වන විටත් එය සතුව පැවති දැවැන්ත අධිරාජ්‍ය මත පදනම්ව තිබීම පමනි. අගය කල යුතු හා අනුගමනය කල යුතු ආදර්ශයක් ලෙස බ්‍රිතාන්‍ය දෙස බලමින් නිතරම හිට්ලර් කථා කලේ, මිලිටරිමය වශයෙන් සෝවියට් සංගමය ජයගැනීමේ අපේක්ෂාව සහිතව රුසියාව "අපගේ ඉන්දියාව" බවට පත්වීම පිලිබඳවය.

බ්‍රිතාන්‍යයේ තත්වය 1934 දී, මුහුදට අරක්ගත් ප්‍රථම රදල අධිපතියා වූ ශ්‍රීමත් අර්න්ලි චැට්ෆීල්ඩ් විසින් පැහැදිලිව කැටිකර දැක්වීය. "අපට දැනටමත් ලෝකයෙන් වැඩි කොටස හෝ එහි හොඳම කොටස් අයත්ව තිබීම නිසා, වෙනත් කිසිවකු සමග අඩ දබර කර ගැනීමේ අවශ්‍යතාවක් නොමැත, සැලකිය යුතු තැනක අපි පසුවන්නෙමු. අපට අවශ්‍ය වන්නේ, අප සතු දේ රැකගැනීම හා වෙනත් අය ඒවා අපගෙන් පැහැර ගැනීම වලක්වා ගැනීම පමනි." (7)

යුරෝපා මහාද්වීපය තුල ජර්මනිය සිය තත්වය ශක්තිමත් කර ගැනීම පිලිබඳව බ්‍රිතාන්‍ය විරුද්ධත්වයක් නොපෑවේය. සැබවින්ම එය එවන් වර්ධනයක් දැක ගත්තේ, ජර්මනිය සෝවියට් සංගමයට පහර දෙනු ඇතැයි යන බලාපොරොත්තුව සහිතව, ප්‍රන්සයට එරෙහි ප්‍රයෝජනවත් ප්‍රති බලයක් ලෙසය. ජර්මනියේ නැගීම බ්‍රිතාන්‍යයේ ම තත්වයට තර්ජනයක් වනු ඇති බව පැහැදිලිව පෙනෙන්නට පටන් ගත් පසුව පමනක් ඔවුන් ජර්මනියට එරෙහිව යුද්ධ ප්‍රකාශ කලේය. යුද්ධයේ අවධිය තුල බ්‍රිතාන්‍ය සටන් කලේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් නොව සිය අධිරාජ්‍ය රැකගැනීමටය.

වසර 1941 දී සෝවියට් සංගමය යුද්ධයට අවතීර්න වීමත් සමඟ, බ්‍රිතාන්‍ය දෙවන පෙරමුන දියත් කිරීම හැකිතාක් කල් ප්‍රමාද කලේය. එහි ප්‍රතිඵලය වූයේ යුද්ධයේ මිත්‍ර ජාතීන්ගේ ජීවිත විනාශයෙන් සියයට 65 ක් සෝවියට් සංගමයට හිමිකර දීමයි. දෙවන පෙරමුන දියත් කිරීමට වඩා චර්චිල් කැමැත්ත දැක්වූයේ, මධ්‍යධරනී කලාපයේ හා මැද පෙරදිග බ්‍රිතාන්‍ය අවශ්‍යතා රැකගැනීම සඳහා උතුරු අප්‍රිකාවේ මිලිටරි මෙහෙයුම් භාරගැනීමටය. යුද්ධයේ අවසන් දිනවල දී මිත්‍ර පාක්ෂික සේනාංක හා ඉතිරිවූ හිට්ලර්ගේ හමුදා යොදාගෙන රුසියානුවන් පෝලන්තයෙන් නෙරපා හැරීමට මෙහෙයුම් සංවිධානය කිරීම ගැන පවා ඔහු සලකා බැලුවේය. එවන් ක්‍රියාන්විතයක් කෙලවර විය හැකිව තිබුනේ ව්‍යසනයකිනි. එහෙත් තම අධිරාජ්‍යයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත් කල නිමක් නැති මිනිස් ජීවිත බිල්ලට දීම චර්චිල්ට කිසිවිටෙකත් ප්‍රශ්නයක් වූයේ නැත.

1904-05 වසරවල යුද්ධයෙන් රුසියාව පරාජය කිරීමත් සමග ජපානය, ලෝක බලවතෙක් ලෙස සිය පැමිනීම නිවේදනය කලේය. පලමු ලෝක සංග්‍රාමයේ දී එය ජර්මනියට එරෙහිව බ්‍රිතාන්‍ය සමඟ පෙලගැසුනි. 1929 බිඳ වැටීම, ජපාන ආර්ථිකය මත ව්‍යසනකාරී බලපෑමක් ඇතිකර තිබුනි. - එක්සත් ජනපදයට සේද රෙදි අලෙවි කිරීම - එහි ප්‍රධාන නිර්යාත වෙලඳපොල එක් රැයකින් අතුරුදහන් විය. ජර්මනියට මෙන්ම ජපානයට ද ආර්ථික ප්‍රසාරනයේ මාවත වැටී තිබුනේ ලෝක වෙලඳපොල හරහා නොවේ, 1933 වන විට ලෝක වෙලඳම 1929 තිබුනායින් තුනෙන් එකක් දක්වා

හැකිලී යාමත් සමග එය මුලුමනින්ම පාහේ අතරුදහන්ව පැවතුනි. ජර්මනිය යුක්රේනයේ හා රුසියාවේ සම්පත් කරා නැගෙනහිර දෙසට හැරුනු අතර, ජපානය බටහිරට නැඹුරු විය. එනම් චීනය වෙතය. 1931 මැන්චූරියාව ආක්‍රමනය කර යටත් කිරීමෙන් පසුව 1937 දී එය රටේ ඉතිරි කොටස ද ආක්‍රමනය කලේය. කෙසේ වෙතත් මෙය එක්සත් ජනපදය සමග ජපානය ගැටුමකට ගෙන ආවේය. චීනයේ දොරවල් වැසී යාමටත් පැසිෆික් කලාපයේ ජපාන අධිරාජ්‍යයක් නැගී ඒමටත් එක්සත් ජනපදය විරුද්ධ විය. සාගරය ජපානයේ නොව ඇමරිකාවේ විලක් විය යුතුව තිබුනි.

සියලු ධනේශ්වර මහා බලවතුන් අතරින් එක්සත් ජනපදය පමනක් අධිරාජ්‍යයක් හඹා නොයන බවක් පෙනී ගියේය. එහෙත්, එක්සත් ජනපදයේ "අධිරාජ්‍ය විරෝධය" එහි එදිරිවාදී අධිරාජ්‍යවාදයේ මූලික ආර්ථික අවශ්‍යතාවන්ගේ ප්‍රකාශනයට වඩා වෙනස් නොවූ හා ඊට නොඅඩු ප්‍රකාශනයක් විය. සාපේක්ෂව ප්‍රමාදවී ලෝක කරලියට පැමිනි එය, පවත්නා අධිරාජ්‍යයන් විසුරුවා හැරීමට මානබලමින් "දොරවල් විවෘත කිරීමේ" මූලධර්මය නිවේදනය කලේය. 19 සියවසේ ප්‍රමුඛ ආර්ථික බලවතාව සිටිමින් හා ලෝකයේ වෙලඳපොලවල් එහි නිර්යාත සඳහා විවර කර ගැනීමට උත්සාහ ගනිමින් "නිර්බාධිත වෙලඳමේ" මූලිකයා බවට බ්‍රිතාන්‍ය පත්වූ ආකාරයට ම එක්සත් ජනපදය ද "අධිරාජ්‍ය විරෝධී" විය.

එක්සත් ජනපදය බලය කරා නැගී ආවේ සමස්ත මහාද්වීපයකම සම්පත් සූරාකෑම තුලිනි. එහෙත් දැන් උතුරු ඇමරිකාවේ පමනක් නොව දකුනු ඇමරිකාවේ සම්පත් සමස්තය ද සෑහුනේ නැත. එක්සත් ජනපදය පලමු ලෝක සංග්‍රාමයට අවතීර්න වූයේ, පශ්චාත් යුද්ධ ලෝක ආර්ථික හා දේශපාලන පර්යාය තුලට තමන්ගේ හස්තය ද රිංගවා ගැනීම සහතික කිරීම සඳහා ය. 1920 ගනන්වල ආර්ථිකයේ යෝධ ප්‍රසාරනයකට පසුව ආ 1930 ගනන්වල ආර්ථික බිඳ වැටීම ද සියල්ලටත් වඩා, නිව් ඩීල් ප්‍රතිසංස්කරනයේ අසාර්ථකත්වය ද හෙලිදරව් කලේ, ඇමරිකානු ධනවාදය මුහුනපා සිටි ගැටලු විසඳිය හැක්කේ ගෝලීය පරිමානයකින් පමනක් බවයි. ඇමරිකානු කර්මාන්තයේ ගතිකය හා ඉහල පලදායීත්වය එසේ ඉල්ලා සිටියේය. එයට, අනෙකුත් අධිරාජ්‍යවාදී බලවතුන්ගේ අධිරාජ්‍යයන් මගින් ලෝකය හකුලුවාලීමේ කොන්දේසි යටතේ ඉදිරියට යා නොහැකි විය.

1914 දී ලියොන් ට්‍රොට්ස්කි මෙසේ ලිවීය: "ජර්මනිය යුද්ධයට ගියේ යුරෝපය සංවිධානය කිරීමේ අරමුන ඇතිවය. ඇමරිකාව දැන් මුහුනපා සිටින්නේ ලෝකය ම සංවිධානය කිරීමේ කර්තව්‍යයටය. කලමනාකරනයේ හා නිෂ්පාදනය එකලස් කිරීමේ පේලි සහිත නව ක්‍රමයන්ගේ වර්ධනයත් සමග ඇමරිකානු ධනවාදය, ශ්‍රම පලදායිත්වය නව මට්ටම් කරා ඔසවාලූ නමුත් එහි ප්‍රසාරනය සෑම තැනක දී ම ඇවිරී තිබුනි. *Nationalism and Economic Life* (ජාතිකවාදය හා ආර්ථික ජීවිතය) නම් සිය ලිපිය තුල 1934 දී ට්‍රොට්ස්කි මෙසේ ලිවීය. "සෑම දෙනාම අන් සියල්ලන්ට එරෙහිව සිය ආරක්ෂාව පතයි. තීරුබදු තාප්ප හා බයිනෙත්තු වැටවලින් තම අරක්ෂාව සලසා ගැනීමට බලයි. යුරෝපය බඩු මිලට නොගනිමින් නය නොගෙවමින් හා ඊට අමතරව තෙමේ සන්නද්ධ වෙයි. කුසගින්නේ සිටින ජපානය කාලකන්නි සේනාංක පහක් යොදාගෙන මුලු රටක්ම අල්ලා ගනියි. ලෝකයේ අති නවීන තාක්ෂනය හදිසියේම, බොහෝ පහත් තාක්ෂනය මත පදනම්ව ඉදිකල බාධකයන් හමුවේ නිෂ්ක්‍රීය වෙයි. ශ්‍රම පලදායිතාවේ නියාමයට එහි බලය අහිමිවී ඇති සෙයක් පෙනීයයි. එහෙත් එසේ පෙනෙනවා පමනි. මානව ඉතිහාසයේ අති මූලික නියාමය ඉක්මනින්ම හෝ පසුව, තවත් එකකින් නිෂ්පන්න මෙම ද්විතීයික සංසිද්ධියෙන්, සිය පලිය ගනු ඇත. ඇමරිකානු ධනවාදය තමන් සඳහා අපගේ සමස්ත ග්‍රහලෝකයේ දිගට හරහට මාවත් විවෘත කර ගන්නවා ඇත. කුමන ක්‍රමෝපායන් ගෙන් ද? සියලු විධික්‍රමයන් මගිනි. පලදායිත්වයේ ඉහල සංගුනකය විනාශකාරී බලයේ ද ඉහල සංගුනකය දරා සිටියි. මම යුද්ධය දේශනා කරන්නෙම් ද? කිසිසේත්ම නැත. මම කිසිවක් දේශනා නොකරන්නෙමි. මම, ලෝක තත්වය විශ්ලේෂනය කිරීමටත්, ආර්ථික යාන්ත්‍රනයේ නියාමයන් වෙතින් නිගමන උපුටා ගැනීමටත් උත්සාහ කරනවා පමනි."

දෙවන ලෝක සංග්‍රාමය ෆැසිස්ට්වාදයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යුද්ධයක් නොව, ලෝකය ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් අතර යලි බෙදාගැනීම සඳහා සිදුවූ අරගලයකි. ජර්මානු අධිරාජ්‍යවාදය, තමන්ට එක්සත් ජනපදය සමග තරගකල හැකි ආර්ථික පදනමක් සහතික කර ගැනීම සඳහා යුරෝපය යටත් කර ගැනීමට, සියල්ලටත් වඩා සෝවියට් සංගමය පරාජය කිරීම සඳහා උත්සාහ කලේය. ජපන් අධිරාජ්‍යවාදය, චීනයේ හා ගිනිකොනදිග ආසියාවේ සම්පත් සූරාකෑම සඳහා නැගෙනහිර ආසියාවේ අධිරාජ්‍යයක් ගොඩනගා ගැනීමට වෙර දැරීය. දැනටමත් අධිරාජ්‍යයක් සතුව සිටි බ්‍රිතාන්‍ය, සිය තරගකරුවන්ගෙන් එය රැකගැනීමට උත්සාහ කලේය. එක්සත් ජනපදය, සිය මහාද්වීපික ආරම්භකත්වයන් ඉක්මවා වැඩී යාමෙන් පසුව සිය ආර්ථික ප්‍රසාරනයේ පැවැත්ම සහතික කර ගැනීමට සමස්ත ලෝකය ම අවශ්‍ය කරන තැනකට පත්ව තිබුනි. එය ජර්මානු, ජපන් අධිරාජ්‍යවාදයට සතුරු වූවාක් මෙන්ම චර්චිල්ට අනුව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ද බිඳ දැමීමට අදිටන් කරගෙන සිටියේය.

යුද්ධය, පැහැදිලිව දැකගතහැකි හේතූන් නිසා ප්‍රජාතන්ත්‍රවාදය, ෆැසිස්ට්වාදය හා මිලිටරිවාදය අතර ගැටුමක රූපය ගත්තේය. මහා බ්‍රිතාන්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදය, ඉංග්‍රීසි නිදහසේ දිගුකාලීන සම්ප්‍රධායන්ගේ පාරිශුද්ධත්වයේ ප්‍රතිපලයක් නොවීය. එය රැඳී තිබුනේ අධිරාජ්‍යයේ ද්‍රව්‍යමය සම්පත් මතය. පාලක පන්තිය විසින් රටතුල ඇතිකල සහන සඳහා කොන්දේසි සැපයුනේ, ලෝකය පුරා මිලියන සිය ගනනක් මිනිසුන් මත අටවා තිබූ විජිතවාදී ආධිපත්‍ය තුලින් උකහාගත් සම්පත් මගින් පමනි. බ්‍රිතාන්‍ය තුල ප්‍රජාතන්ත්‍රවාදය රැඳී පැවතුනේ ඉන්දියානු උප මහාද්වීපයේ ජනතාවන්ට ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීම මතය. එක්සත් ජනපදයට දේශපාලන සහන පිදීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී රූපාකාරයන් රඳවාගැනීමටත් හැකියාව ඇති කලේ දැවැන්ත මහාද්වීපයෙන් එය උපුටාගත් ධනය නිසාය. ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සියලු උත්සාහයන්හි අරමුන වූයේ, තම ප්‍රතිමල්ලවයන්ට එරෙහිව තමන්ගේ වරප්‍රසාද රැකගැනීමයි. අවශ්‍ය වූයේ නම්, ෆැසිස්ට්වාදය සමග සම්මුතියක් වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය අතහැර දැමීමට පාලක පන්තීහු ඕනෑවටත් වඩා සූදානම්ව සිටියහ. ප්‍රන්සය පිලිබඳ මහා පාඩම නම් එයයි. බොහෝ අංශ වලින් නූතන ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ මවුබිම වූ එහි ධනේශ්වරය, 1940 ජූනි මාසයේදී ඉක්මනින්ම හිට්ලර්ට යටත්වූ අතර රූකඩ තන්ත්‍රයක් පිහිටුවනු ලැබුවේ, කම්කරු පන්තියට බලය ලබාගැනීම සඳහා මාවතක් විවර කරනවාට වඩා එය අවදානමෙන් අඩු යයි සලකමිනි. සියල්ල අහිමිවීමේ අවදානමට මුහුන දෙනවාට වඩා ෆැසිස්ට්වාදයේ තාඩන පීඩන වලට මුහුන පෑම ඇඟට ගුන යයි සලකමිනි.

1930 ගනන් පුරා ට්‍රොට්ස්කි යලි යලිත් අවධාරනය කලේ, සමාජවාදී විප්ලවයකින් තොරව යුද්ධය වැලැක්විය නොහැකි බවය. මහජනතාවගේ යුද විරෝධී මානසිකත්වය කොතෙක් බලවත් වුවත්, යුද්ධයෙන් ජනිත කෙරෙන මරනයේ හා ව්‍යසනයේ ප්‍රචන්ඩත්වය කොතෙක් බලගතු වුවත් පැරනි පාලක පන්තීන් පෙරලා නොදමා යුද්ධය අවසන් කල නොහැක්කේ, එය මතුව එන්නේ ධනේශ්වර පද්ධතියේ පතුලෙන්ම නැගෙන ප්‍රතිවිරෝධයන් හා ගාමක බලවේගයන්ගෙන් වීම නිසාය.

මෙ මගින් සනිටුහන් කරන්නේ, කම්කරු පන්ති නායකත්වයේ අර්බුදය විසඳීමේ අරගලය අතිශයින්ම තීරනාත්මක ප්‍රශ්නය බවයි. රුසියානු විප්ලවය තුල ඔහුගේ දැවැන්ත භූමිකාව තිබියදී ම ට්‍රොට්ස්කි, 1938 දී සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ලෙස හතරවන ජාත්‍යන්තරය ගොඩනැගීම තම ජීවිතයේ වැදගත්ම කර්තව්‍ය වූ බව අවධාරනය කලේ එබැවින්ය. කම්කරු පන්තියේ නායකත්වය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ස්ටැලින්වාදී නායකත්වය අත රැඳී තිබෙන තාක් දුරට යුද්ධය නොවැලැක්විය හැකිය. යුද්ධය කරා තල්ලුව වේගවත් කලේ මෙම නායකත්වයේ පාවාදීමයි.

යුද්ධය දියත් කිරීමෙන් කුමන ප්‍රතිවිපාක උද්ගත කරනු ඇද්ද යන්න පිලිබඳව පාලක පන්තීන්ට යම් බියක් පැවතියේ නම් ඒවා, 1936 ස්පාඤ්ඤයේ හා ප්‍රන්සයේ පාවාදීම් මඟින් යම්තාක් දුරකට සමනය කරනු ලැබිනි. 1936 ආරම්භවූ ස්පාඤ්ඤ විප්ලවයත්, 1939 දක්වා පැවති සිවිල් යුද්ධයත් පරාජය කරනු නොලැබූ අතර පාවාදෙනු ලැබිනි. ස්ටැලින්වාදීන් මෙන්ම ජීපීයූ නමැති සෝවියට් සංගමයේ රහස් පොලිසියත් කම්කරු පන්තිය පරාජය කිරීම සඳහා ඉතා දැනුවත්ව වැඩ කලේය. සමාජවාදී විප්ලවය ජාත්‍යන්තරව පැතිරී යාම පිලිබඳ සිය විරුද්ධත්වය ස්ටැලින් විසින් ලෝක ධනේශ්වරයට සහතික කලේ එසේය. ඒ සමග ම, මාධ්‍යමිකවාදීන් හා අරාජිකවාදීන් බලය සඳහා අරගලය පෙරට ගෙනයාමේ තීරනාත්මක කර්තව්‍ය මගහරිමින් ධනේශ්වර ආන්ඩුවලට ඇතුල් වූ අතර, ෆ්‍රැන්කෝගේ ජයග්‍රහනය සඳහා මග හෙලි පෙහෙලි කලේය. 1936 මහා වැඩ වර්ජනයත් සමඟ ප්‍රන්සය තුල විප්ලවවාදී විභවයක් සහිත තත්වයක් වර්ධනය වූ අතර, ධනේශ්වර මහජන පෙරමුනු ආන්ඩුවට කම්කරු පන්තිය යටත් කිරීම මගින් එය වනසා දමන ලදී. ෆැසිස්ට්වාදය වැලැක්වීම කෙසේ වෙතත්, මහජන පෙරමුන කලේ එයට දොර විවර කිරීම පමනි. ප්‍රන්සය තුල 1940 සිදුවීම් තුලින් එය මනාව පෙන්නුම් කලේය.

## නව ලෝක යුද්ධයක අන්තරාය

මෙම පාඩම් වර්තමාන තත්වයට දැවෙන අදාලත්වයක් ගැබ්කර ගනියි. පලමුවන හා දෙවන ලෝක යුද්ධවල ඉතිහාසය සමාලෝචනය කිරීමේ දී, මෙය යලිත් සිදුවිය හැකි ද යන ප්‍රශ්නය වහාම මතුවෙයි. අපි යලිත් ලෙනින් අවධාරනය කල කාරනය සැලකිල්ලට ගනිමු. යුද්ධයෙන් සාමය මතුව එන අතර, ඒ සමග ම සාමය, නව යුද්ධ හටගැනීමට මග පාදයි.

1914 වසරේ යුරෝපයෙන් ආරම්භවී මුලු ලෝකයම වෙලාගත් 30 වසරක ලේවැකි ගැටුම, එක්සත් ජනපදය හා එහි මිත්‍ර පාර්ශවය ද, නාසි ජර්මනියට හා ජපානයට එරෙහිව සෝවියට් සංගමය ද, 1945 දී ලත් ජයග්‍රහනයෙන් අවසානයකට පත් විය. ආර්ථික ප්‍රසාරනයත් සමග අත්වැල් බැඳගෙන, අධිරාජ්‍යවාදී බලවතුන් අතර සාමය ඇති කල පශ්චාත් යුද්ධ සමතය, රඳාපැවතුනේ අත්තිවාරම් දෙකක් මතය. සිය අධිරාජ්‍යවාදී පිලිමලුන් මත පිහිටුවූ එක්සත් ජනපද ආර්ථික ආධිපත්‍ය හා මුලුමනින්ම යටපත් නොකලේ වී නමුත්, අධිරාජ්‍යවාදී බලවතුන් අතර ගැටුම් අඩුම තරමින් නියාමනය කිරීමට අත දුන් සීතල යුද්ධය ඒ දෙකයි. බටහිර හා නැගෙනහිර වශයෙන් යුරෝපය

බෙදී යාම මගින්, ගෝලීය ගැටුම් දෙකක් ඇවිලවූ ගිනි පුපුර, එනම් "ජර්මන් ප්‍රශ්නය" සමතයකට පත් කලේය.

ඇමරිකානු සංහිඳියාව ලෙස හැඳින්වූ මෙම කුලුනු දෙක, ඇද වැටී තිබේ. එහි ප්‍රතිවිපාක වශයෙන්, පසු ගිය 20 වසර පුරා වැඩී ගියේ, 1930 ගනන් වලින් මෙපිට දක්නට නොලැබුනු වර්ගයේ මිලිටරි ප්‍රචන්ඩත්වය හා පරිපූර්න මැරවරකම් ය. අපි නැවතත් ලෙනින්ගේ විශ්ලේෂනය සිහියට නඟාගනිමු. එක් අධිරාජ්‍යවාදී බලවතෙකුගේ අධිකාරිය යටතේ හෝ එවන් බලවතුන් ගනනාවක් අතර ඇති කර ගත් එකඟතාවක් මඟින් හෝ පිහිටුවා ගත් පොදු සාමය, සදාකාලිකව පවත්වා ගත නොහැකිය. ඒ, ධනේශ්වර සංවර්ධනය සිදු වන්නේ අසමාන ලෙසින් වීමත්, සම්මුතිය ඇති කරගත් බලවතුන් අතර ආර්ථික සම්බන්ධතා නිසැකව ම වෙනස්වන බැවිනුත් ය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව සිදුව ඇත්තේ මෙයයි.

පශ්චාත් යුද්ධ සමතය මගින් ලෝක ධනේශ්වර ආර්ථිකය තුල ඇතිකල හැකිවූ එම ප්‍රසාරනය ම හේතුකොටගෙන, 1945 පටන් එක්සත් ජනපදයේ ආර්ථික ප්‍රමුඛත්වය එක දිගට ඛාදනය වී තිබේ. එක්සත් ජනපද ධනවාදයේ ස්ථාවරත්වයට නැතුව ම බැරිවූ, ජර්මනිය හා ජපානය යන පරාජිත බලවතුන්ගේ ආර්ථික වර්ධනය, එක්සත් ජනපදයේ සාපේක්ෂ ආධිපත්‍යයේ පරිහානියට තුඩුදී තිබේ. මෙම ක්‍රියාවලියේ ගුනාත්මක සන්ධිස්ථානය ලඟා වූයේ 1971 ය. වෙලඳ හිඟය පසු පසින් එක දිගට ඉහල නැගුනු ගෙවුම් ශේෂ හිඟය මධ්‍යයේ නික්සන් පරිපාලනය, එක්සත් ජනපද ඩොලරයේ රත්රන් සහතිකය ඉවත් කරගත් අතර, ගෝලීය ආර්ථික පර්යායේ මුල් ගලක්ව තිබුනු බ්‍රෙට්න්වුඩ්ස් මූල්‍ය පද්ධතිය සුන් කලේය. 1980 ගනන් අවසානය වන විට, පූර්වයෙන් ලෝකයේ ප්‍රමුඛ නය දෙන ජාතියව සිටි එක්සත් ජනපදය ලෝකයේ විශාලතම නයගැතියා බවට පත්ව තිබුනි.

අර්බුදය මගින් අද දිනයේ, එක්සත් ජනපද මූල්‍ය පද්ධතිය, එහි හදවත තුලම කුනුවීම හා දිරාපත්වීම එලිමහනට ගෙනැවිත් තිබෙනවා පමනක් නොව, චීනය හා ඉන්දියාව වැනි නැගී එන නව බලවතුන්ගේ අභියෝගයට මෙන්ම, නැගී එන පැරනි බලවතුන්ට ද මුහුනපා සිටියි. ඔවුහු හිරු එලියේ තමන්ගේ තැන ඉල්ලා සිටිති. ලෙනින් පැහැදිලි කල පරිදි, ධනවාදයේ අසමානවූ ආර්ථික පදනම් විසින් ම, පැරනි දේශපාලන සම්බන්ධතා රැඳී පැවතුනු ආර්ථික පදනම්, බිඳ දමා තිබේ. නව සම්බන්ධතා පිහිටුවීමට යන්නේ සාමකාමීව නොව ගැටුම් හරහාය.

සැබවින්ම මේ ක්‍රියාවලීන් දැනටමත් දියත්වී හමාරය. පසුගිය දශක දෙක පුරා පුපුරා ගිය අධිරාජ්‍යවාදී ප්‍රචන්ඩත්වයේ වැදගත්කම මෙයයි. 1990 ගනන් ආරම්භයේ සෝවියට් සංගමයේ බිඳ වැටීම එක්සත් ජනපදය විසින් ඩැහැගනු ලැබුවේ, සිය ඉමහත් මිලිටරි බලය යොදාගනිමින් තම ආර්ථික පරිහානිය ජය ගැනීමේ අවස්ථාවක් ලෙසය. ඊනියා "ඒක ධ්‍රැවීය" අවස්ථාව ලෙසින් අර්ථ ගැන්වුනේ මෙයයි. එතැන් පටන් එක්සත් ජනපදය යුද්ධ මාලාවක් දියත් කර තිබේ. 1990 ගල්ෆ් යුද්ධයත්, දශකය පුරා යුගෝස්ලාවියාව කඩා බිඳ දැමීමත්, ඉන් පසුව 1999 සර්බියාවට එරෙහි යුද්ධයත් දියත් කරන ලදී. ක්ලින්ටන් පරිපාලනය 1998 දී ඉරාකයට එරෙහි දෙවන යුද්ධයම බව කිව හැකි ආක්‍රමනයක් දියත් කලේය. පසුව පැමිනියේ 2001 සැප්තැම්බර් සිදුවීම්ය. බුෂ් පරිපාලනය එය ඩැහැ ගත්තේ හොඳින් සැලසුම් කල ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය මෙහෙයවීමට ය. එය පසුපස 2003 දී ඉරාක යුද්ධය ඇරඹිනි. දැන්, ඔබාමා පාලනය යටතේ ඇෆ්ගනිස්ථාන යුද්ධය වේගවත් කරමින් පකිස්ථානය තුලට ම එය පතුරුවා හැර තිබේ. එක්සත් ජනපදය මධ්‍යම ආසියාවේ දැවැන්ත සම්පත් මත අධිකාරය පිහිටුවීමට උත්සාහ කරන අතර, සිදුවන දේ 1930 දශකය තුල නාසි ජර්මනිය සිදුකල අපරාධයන්ට කිසි සේත්ම දෙවෙනි නොවේ.

අප ඉදිරියේ ඇති සැබෑ ප්‍රශ්න, තවත් ගෝලීය යුද්ධයක් ඇතිවීමේ හැකියාව පිලිබඳ කනස්සල්ල පමනක් නොවේ. ඊට අමතරව ඒ සඳහා කොපමන කලක් ගතවේ ද හා එය වැලැක්වීමට කල හැක්කේ කුමක් ද යන්න ද ඇතුලත්ය.

පරදුවට තැබී ඇති ප්‍රශ්න උපුටා දැක්වීම සඳහා ඇලෙක්ස් කැලැනිකෝස් විසින් මෑතකදී රචිත *Imperialism and Global Political Economy* (අධිරාජ්‍යවාදය හා ගෝලීය දේශපාලන ආර්ථිකය) නමැති ග්‍රන්ථය වෙත අවධානය යෙදීමට මම කැමැත්තෙමි. කැලනිකෝස් මහතා බ්‍රිතාන්‍ය සමාජවාදී කම්කරු පක්ෂයේ ප්‍රමුඛ සාමාජිකයෙක් හා තමන් මාක්ස්වාදියෙකු, ලෙනින්වාදියෙකු හා විප්ලවවාදියෙකු ලෙස සලකා ගන්නා අයෙකි. අධිරාජ්‍යවාදය පිලිබඳ න්‍යායික හා ඓතිහාසික විශ්ලේෂනයකින් පසුව, ඔහු මෙම නිගමනය කරා පැමිනෙයි. එනම්, "දියුනු ධනේශ්වර කලාපයන්හි එක්සත් ජනපදය පවත්වාගෙන යන අධිකාරය මගින්, අවසානයේ ලෝක යුද්ධ බවට පත්වුනු 20 සියවසේ අන්තර් අධිරාජ්‍යවාදී එදිරිවාදිකම් වලට සමාන්තරව යන පරිද්දෙන්, අත්ලාන්තිකය හරහා දිවෙන කලාපයේ රටවල් අතර අන්තර්-ධනේශ්වර ආර්ථික එදිරිවාදිකම් පිලිබඳ අන්තරායක් නැතැයි යන සර්ඵාටිගේ නිගමනයට සැලකිය යුතු සහායක් පලවෙයි." (8) ඔන්න, දැන් ඉතින් සියලු දෙනාට නිස්කලංකයේ සිටිය හැකිය.

කැලිනිකෝස්ට අනුව, අන්තර් අධිරාජ්‍යවාදී යුද්ධය "අභව්‍ය" දෙයක් වන්නේ පහත සඳහන් සාධක නිසාය. එක්සත් ජනපදය සතු ඉහ වහා යන මිලිටරි

අධිකාරය, දියුනු ආර්ථිකයන්ගේ අන්තර් රඳපැවැත්ම, ඔවුන් එකට බැඳ තබන දේශපාලන සහයෝගීතාවය හා යුද්ධයට අනුබලයක් නොවන පරිද්දෙන් න්‍යෂ්ටික ආයුධවල පැවතීම යනාදියයි. න්‍යෂ්ටික අවි හැරුනු කල මෙම සියලු සාධක, 20 වන සියවසේ මුල් දශකයේදී, අනෙකුත් අය අතර ගත් කතුවර නෝමන් ඒන්ජල් විසින් ද සඳහන් කර තිබුනි. එහෙත්, එසේ තිබියදී ම යුද්ධය පැනනැගුනි.

2007-08 මූල්‍ය අර්බුදයේ අත්දැකීම් කවරක් වී ද? විවිධ "වාම" හා ඊනියා "මාක්ස්වාදී" ශාස්ත්‍රාලිකයන් විසින්, ලෙනින්ගේ විශ්ලේෂනය තව දුරටත් වලංගු නොවන බවටත්, නිශ්චිත ව්‍යාපාරික හා මූල්‍ය ආසක්තයන්ගෙන් යුත් ධනේශ්වර බලවතුන් තවදුරටත් විශේෂිතව හඳුනාගත නොහැකි බවටත් කරන සියලු ප්‍රකාශ තිබියදීත්, සියවස් තුන්කාලක් ඇතුලත හටගත් දැවැන්තම ආර්ථික අර්බුදයට කුමක් සිදුවී ද? සිදුවීම් පිලිබඳ පරීක්ෂනය කුමක් වී ද? සම්බන්ධීකරනය කල ජාත්‍යන්තර ප්‍රතිචාරයක අවශ්‍යතාව ගැන කටින් බතලකොල සිටුවන ගමන්, සියලු ප්‍රධාන ආන්ඩු, ඔවුන්ගේ ම බැංකු පද්ධතීන් හා ව්‍යාපාර රැකගැනීමට දිව ගියහ.

එක්සත් ජනපදය සිය මිලිටරි ශක්තිය ඉදිරියට දමන බව කැලිනිකෝස් විසින් ප්‍රතික්ෂේප නොකරයි. එහෙත්, "ජාත්‍යන්තර ප්‍රජාවගේ නාමයෙන් දියුනු ධනවාදයේ දේශ සීමාවන්ගෙන් ඔබ්බෙහි එනම්, ඉන් පිටත, අන්තරායකාරී දේශසීමා කලාපයන් කරා මෙම මිලිටරි බලය ඉදිරියට දමන" බව පෙන්වා දෙයි. පලමු හා දෙවන ලෝක සංග්‍රාමයන් පිලිබඳව හදාරන ඕනෑම ශිෂ්‍යයෙකු දන්නා පරිදි, එමෙන්ම කැලිනිකෝස් ද හොඳින්ම දන්නා පරිදි, මෙම අන්තර් අධිරාජ්‍යවාදී ගැටුම් ඇරඹුනේ හරියටම මෙම "දේශසීමා කලාපයන්හි" ය. බෝල්කන් ප්‍රදේශ, පෝලන්තය, මැන්චූරියාව යන කිසිවක් ලෝක ධනේශ්වර ආර්ථිකය මධ්‍යයේ පිහිටියේ නොවේ. අද දින ජෝර්ජියාව ද එසේ නොවේ. එහෙත් 2008 වසර මැද, රුසියාව සමග හටගත් ගැටුම තුල මතුවූ ආතතීන් යමෙකු සිහියට නගාගත යුතුය. එකිනෙකාට වෙනස් අධිරාජ්‍යවාදී බලවතුන්ගේ අවශ්‍යතා, එකිනෙකාට හරස් වූයේ හා ගැටුනේ මෙම ඊනියා "දේශසීමා කලාපයන්" තුලය. මැද පෙරදිග, ඇෆ්ගනිස්ථානය, මධ්‍යම ආසියාව, කැස්පියන් මුහුදු කලාපය, අප්‍රිකා මහාද්වීපයේ හා ලෝකය පුරා වෙනත් නොයෙකුත් අඩමාන තැන්වලදී ද තත්වය මෙයයි. කැලිනිකෝස් ධනවාදයේ හා අධිරාජ්‍යවාදයේ විරුද්ධවාදියෙකු ලෙස තෙමේම ඉදිරිපත්ව සිටියි. එහෙත් ඔහු ගෙන එන්නේ කුමන ඉදිරිදර්ශනයක් ද? ඔහු නිගමනය කරන්නේ 21 වන සියවස මහා බලවතුන්ගේ ඒකමතික සංදර්ශනයක් ලෙසින් අංගලක්ෂනය "නොවිය හැකි" ය කියායා. ප්‍රතිකර්මය වන්නේ, "ධනවාදය, ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රගතිශීලී විකල්පයක් සමගින් ඌනපූරනය කිරීමයි." මෙය සටහන් කරගත යුතුය. එනම්, ධනවාදය පෙරලා දමා ජාත්‍යන්තර සමාජවාදය පිහිටුවීමෙන් නොවේ.

ඉහල නගින ගෝලීය ආර්ථික හා දේශපාලන ආතතීන් පෙන්නුම් කරන්නේ, අලුත් වන ලෝක යුද්ධයක අනතුරයි. එය වැලැක්විය හැක්කේ කෙසේ ද? මහජනතාවන් ඓතිහාසික ක්‍රියාදාමය තුලට පිවිසීම මගින් පමනකි.

කෙසේ වෙතත්, මෙම ජනතාවන් ස්වාධීන ක්‍රියාමාර්ගයකින් හා ඉදිරිදර්ශනයකින් සන්නද්ධ කල යුතුය. ලෝකය පුරා මිලියන ගනන් ජනතාව 2003 පෙබරවාරියේදී ගෝලීය පරිමානයෙන් පෙලපාලි දක්වමින් ඉරාක යුද්ධය වැලැක්වීම සඳහා මැදිහත් වූහ. එහෙත්, මෙම ව්‍යාපාරයේ දුබල කම හා එය අසාර්ථක වීමේ හේතුව ද වූයේ එය සතුව ස්වාධීන ක්‍රියාමාර්ගයක් නොතිබීමයි. එය, එක්සත් ජනපද ඩිමොක්‍රටිකයන්, ඕස්ට්‍රේලියාවේ ලේබර් පක්ෂය හෝ ප්‍රන්සය පිලිබඳ නිෂ්ඵල බලාපොරොත්තු මත හෝ එක්සත් ජාතීන් හෝ අනෙකුත් යම් බලවතෙක් යුද්ධය නැවැත්වීමට මැදිහත් වනු ඇතැයි කියා සිටි අධිරාජ්‍යවාදී ධනේශ්වරයේ පක්ෂ වලට යටත්ව තිබුනි. එවන් දිශානතියක ප්‍රතිවිපාක පසුගිය සතියේ ප්‍රසිද්ධ කල බොහෝ දේ කියාපාන ඡායාරූපයක් තුල මනාව කැටි කොට දක්වා තිබුනි. එහි දැක්වුනේ ලේබර් පක්ෂ ආරක්ෂක ඇමති ජෝන් ෆෝක්නර්, ඉරාකයේ "තල්ලුව" යුද මෙහෙයුමට මුල්වූ එක්සත් ජනපදයේ ජෙනරාල් ඩේවිඩ් පෙට්රාවුස් වෙත ඕස්ට්‍රේලියාවේ ඉහලම නම්බු නාමය සංකේතවත් කරන පදක්කමක් පිරිනමන ආකාරයයි.

අප හමුවේ මතුවන ප්‍රධාන ම ප්‍රශ්නය මෙයයි. ධනවාදය යලි වතාවක් මනුෂ්‍ය ශිෂ්ඨාචාරය ව්‍යසනයක් කරා ඇද දැමීමට තර්ජනය කරන්නේය යන්නයි. මනුෂ්‍ය වර්ගයා 20 වන සියවස තුලින් ගමන්කොට තිබේ. එහෙත් ඒ යාන්තමින් පන බේරාගෙනය. මෙවර සියල්ල රැඳී ඇත්තේ ජාත්‍යන්තර සමාජවාදයේ සංස්කෘතියෙන් පොහොසත් කල කම්කරු පන්තිය, දේශපාලනිකව ප්‍රති සන්නද්ධ කිරීම මතය. ජාත්‍යන්තර කමිටුව හා එහි ඕස්ට්‍රේලියානු ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය කැපවී සිටින කර්තව්‍ය වන්නේ මෙයයි. මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ මනුෂ්‍ය වර්ගයාගේ අනාගතය සුරක්ෂිත කිරීමෙහිලා ඔබගේ භූමිකාව ඉටු කිරීම සඳහා පක්ෂයට බැඳෙන ලෙසයි.

**සටහන්:**

(1) වින්ස්ටන් චර්චිල්, "සයොනිස්ම් වර්සස් බොල්ශෙවිසම්", (බොල්ශෙවික්වාදයට එදිරිව සියොන්වාදය) 1920 පෙබරවාරි 8, *හිස්ටොරිකල් ස්ටඩී හෙරල්ඩ්.*

(2) රොබට් බ්ලැක්ගේ *Stalinism in Britain* (බ්‍රිතාන්‍ය තුල ස්ටැලින්වාදය) හි දැක්වෙන, නිව් පාක් පබ්ලිකේෂන්, ලන්ඩන් 1970.

(3) නිකල්සන් බේකර්ගේ *Human Smoke* (මනුෂ්‍ය දුමාරය) සයිමන් හා ෂුස්ටර්, නිව් යෝර්ක්, 2008, 117 පිටුව.

(4) නිකල්සන් බේකර්, *හියුමන් ස්මෝක්*, 236 පිටුව.

(5) *නිව් යෝර්ක් ටයිම්ස්* 1995 මාර්තු 9

(6) ජෙරාඩ් අයි වේන්බර්ග්ඩ්, *Hitler's Second Book* (හිට්ලර්ගේ දෙවන පොත) එනිග්මා බුක්ස්, 2003 නිව් යෝර්ක්, 107-116 පිටු

(7) කැලිනිකෝස්ගේ *Imperialism and Global Political Economy* (අධිරාජ්‍යවාදය හා ගෝලීය දේශපාලන ආර්ථිකය) පොලිටි, කේම්බ්‍රිජ්, 2009, 168 පිටුව.

(8) කැලිනිකෝස්, 217 පිටුව.

© www.wsws.org